**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය 2021/2022**

**SOC 4186 – සමකාලීන සමාජ න්‍යාය**

**කාලය : පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. 1.1 ජෝං බෝද්‍රියාඩ්ගේ (Jean Baudrillard) ආභාසනය යන සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 05)

1.2 ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයට පරිභෝජන සංස්කෘතිය කොතෙක්දුරට බලපා ඇත්දැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 15)

2. 2.1 "පාණ්ඩුකරණත්වය" (Governmentality) යන අදහස කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

2.2 "නූතන මිනිසාව නිරන්තරයෙන් නිරීක්ෂණයට භාජනය වේ." මෙම ප්‍රකාශය මිෂෙල් ෆූකෝගේ පැනොප්ටිකන් සංකල්පය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

3. පියරේ බෝඩියෝට අනුව පාසල් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය මඟින් පුද්ගල පෞරුෂය තුළ ගොඩනගන සංස්කෘතික ප්‍රාග්ධනය සමාජ අසමානතාව නිර්මාණය කරයි. ඉහත ප්‍රකාශය විචාරාත්මකව විමසන්න. (ලකුණු 20)

4. සමාජ ප්‍රපංචයක් හා පුද්ගල ක්‍රියාවක් අවබෝධ කරගැනීමට ෂාක් ඩෙරීඩා (Jacques Derrida) විසින් හඳුන්වාදෙන ලද පයීතය (Text) පිළිබඳ අදහස බෙහෙවින් වැදගත් වේ. ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

5. පශ්චාත් නූතනත්වාදී ප්‍රවේශ මඟින් උල්රිච් බෙක් (Ulrich Beck) හා සිග්මන් බෞමන් (Zygmunt Bauman) නූතන සමාජය තුළවන අවිනිශ්චිතභාවය හුවා දක්වයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

6. පහත සඳහන් ඕනෑම මාතෘකා 03ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ලකුණු 5x4 = 20)

1) ෆර්ඩිනන්ඩ් සෝසියර්ගේ ව්‍යුහවාදය (Ferdinand Saussure / Structuralism)
2) කතිකාව (Discourse)
3) හැබිටුවස් (Habitus)
4) අධියථාර්ථය (Hyper reality)
5) පුද්ගලාර්ථකරණය (Individualization)
6) ජගන් හබමාස්ගේ විචාර න්‍යාය (Critical Theory of Jurgan Habermas)

**************